# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/73 - 2020 මාර්තු මස 07 වැනි සෙනසුරාදා - 2020.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 මාර්තු මස 08 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක් වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2019.09.10 දිනැති අංක 2140/20 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් උඳු (රේගු සංකේතාංක 0713.31.22 සහ 0713.31.29) සඳහා ප්‍රකාශිත අදාළ නියමයන් 2020 මාර්තු මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 මාර්තු මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 01. | 03.03 | 0303.54 | මැකරල් (ස්කොම්බර් ස්කොම්බ්‍රුස්, ස්කොම්බර් ඔස්ට්‍රාලසිකස්, ස්කොම්බර් ජැපොනිකස්) | කි. ග්‍රෑමයට රු. 6.00 |
| 02. | 07.13 | 0713.31.22 | උඳු : පිට කුරුට්ට ඉවත්කළ, පියළි කළ හෝ පියළි නොකළ | කි. ග්‍රෑමයට රු. 300.00 |
| | | 0713.31.29 | උඳු : අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 03. | | 0713.35.90 | අනෙකුත් - කව්පි | කි. ග්‍රෑමයට රු. 70.00 |
| 04. | 10.08 | 1008.21.10 | බීජ - කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.21.90 | බීජ අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.10 | අනෙකුත් - කුරක්කන් (ඉලූයුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.90 | අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 70.00 |

03 - 904

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.